**පිවිතුරු බලශක්ති සහ ජාල කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (07 කොටස) - 2014**

පිවිතුරු බලශක්ති සහ ජාල කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ (07 කොටස) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ආසියානු සංවර්ධන බැංකුව (ආසබැ) සහ ලංකා විදුලිබල මණ්ඩලය හා සුනිත්‍ය බලශක්ති අධිකාරිය අතර 2013 මැයි 08 දින එළඹි අංක එස්ආර්අයි 43576 දරන ව්‍යාපෘති ගිවිසුමේ 2.09 (අ) ii වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (I) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘති කාලය**

ව්‍යාපෘතියේ ගිවිසුම අනුව, විදුලිබල සහ පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වේ. ලංකා විදුලිබල මණ්ඩලය සහ සුනිත්‍ය බලශක්ති අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ 01 කොටස සිට 06 කොටස දක්වා කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා ලංකා විදුලි බල මණ්ඩලය වගකීම දරන අතර ව්‍යාපෘතියේ 07 කොටස යටතේ දැක්වෙන කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වගකීම දරයි. ව්‍යාපෘතියේ 07 කොටස යටතේ සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන කාර්යයන් පිළිබඳ විගණන නිරීක්ෂණයන් මෙම වාර්තාවේ ඇතුළත් වේ. පිවිතුරු විදුලිබල සැපයුම වැඩිකිරීම සහ ශ්‍රී ලංකාවේ විදුලි බලය බෙදාහැරීමේ කාර්යක්ෂමතාවය හා විශ්වාසය වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ව්‍යාපෘති පරිපාලන අත්පොත අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 25,240 කට සමාන එජඩො මිලියන 200 ක් වන අතර ඉන් රු.මිලියන 378.6 කට සමාන එජඩො මිලියන 3.00 ක් ව්‍යාපෘතියේ 07 - කොටස සඳහා වෙන්කර තිබුණි. ව්‍යාපෘතියේ සියලු කොටස් සඳහා කරන ලද මූල්‍ය සැලසුම් සාරාංශ කර පහත දැක්වේ.

| ප්‍රභවය | එජඩො (මිලියන) | ශ්‍රී ලංකා රුපියල් (මිලියන) |
|---|---|---|
| ආසියානු සංවර්ධන බැංකුව | | |
| - ආසියානු සංවර්ධන අරමුදල (ණය අංක 2892 එස්ආර්අයි - 2013 මැයි 08 දින) | 30.0 | 3,786.00 |
| - සාමාන්‍ය ප්‍රාග්ධන සම්පත් (ණය අංක 2893 එස්ආර්අයිඑස්එෆ් 2013 මැයි 08) | 100.00 | 12,620.00 |
| - පිවිතුරු බලශක්ති අරමුදල (ප්‍රදාන අංක 0303 එස්ආර්අයි ඊඑෆ් 2018 අගෝස්තු 08 දින) | 1.50 | 189.30 |
| ශ්‍රී ලංකා රජය | 68.50 | 8,644.70 |
| | 200.00 | 25,240.00 |

ව්‍යාපෘති කටයුතු 2013 සැප්තැම්බර් 30 දින ආරම්භ කරන ලද අතර 2017 ජුනි 30 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘතිය නිම කිරීමේ දිනය 2019 ජුනි 30 දක්වා දීර්ඝ කරන ලදී.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩි දියුණුකළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ අරමුදල් සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල් වලින් දරන ලද ව්‍යාපෘති වියදම, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු වලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණය සහ ප්‍රදාන යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි විශ්වාසය තැබිය හැකිද යන බව.

(ඊ) ණය සහ ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(උ) ණය සහ ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඌ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(එ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඒ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන් වලට අනුකූල වූයේද යන බව.

## 2 මූල්‍ය ප්‍රකාශන

--------------

### 2.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය හා ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණය සඳහා වූ ඉල්ලුම්පත් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව, සහ

(ඈ) ණය හා ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

#### 2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 හි - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම 19 ඡේදයේ අවශ්‍ය පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා කළමනාකරණයේ වගකීම පිළිබඳ ප්‍රකාශය ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ ව්‍යාපෘතියේ 7 කොටස සඳහා අරමුදල් උපයෝජනය සහ 2014 දෙසැම්බර් 31 දක්වා සමුච්චිත වියදම පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය සහ ප්‍රදාන ගිවිසුම් අනුව මූල්‍යායනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම් | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ආසබැ ණය | 1.50 | 189.30 | - | - | - | - | - |
| ආසබැ ප්‍රදාන | 1.50 | 189.30 | 70.00 | 0.03 | 4.40 | 0.03 | 4.40 |
| ශ්‍රී ලං ර | 0.08 | 10.00 | 5.00 | 0.002 | 0.30 | 0.002 | 0.30 |
| එකතුව | 3.08 | 388.60 | 75.00 | 0.032 | 4.70 | 0.032 | 4.70 |

### 3.2 භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතියේ අරමුණුවලට අනුව, රාජ්‍ය-පුද්ගලික හවුල්කාරිත්වය පදනම යටතේ පියැසි මුදුන්හි සූර්ය කෝෂ බලශක්ති උත්පාදන පිරියත සවිකිරීම සඳහා විශ්වවිද්‍යාල, හෝටල්, කර්මාන්තශාලා සහ වෙනත් වාණිජමය ඒකක වැනි ආයතනවලට සහාය වීම සඳහා සුනිත්‍ය බලශක්ති අධිකාරිය කටයුතු කිරීම අවශ්‍ය වේ. එබැවින් සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ජාතික උපදේශකවරයකු පත්කර, සමාලෝචිත වර්ෂය තුළ ජාතික විශ්වවිද්‍යාල 04 ක පියැසි මුදුන්හි සූර්ය බලශක්ති පද්ධති සවිකිරීම සඳහා මූලික කාර්යයන් ආරම්භ කර තිබුණි.

## 4 මූල්‍ය පාලන පිළිබඳ ගැටලු

මුදල් රෙගුලාසි 134 (3) හා 2010 ජුලි 26 දිනැති අංක 05 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ අවශ්‍ය පරිදි ව්‍යාපෘතියේ ගනුදෙනු සුනිත්‍ය බලශක්ති අධිකාරියේ අභ්‍යන්තර විගණන අංශයේ විගණනය සඳහා භාජනය කර නොතිබුණි.